අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Dancing(Oriental)

# නැටුම් (දේශීය)



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa
The National e-learning Portal for The General Education

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 44 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**නැටුම් (දේශිය) I,II**
நடனம் (சுதேச) I,II
Dancing (Oriental) I,II

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
மேலதிக வாசிப்பு நேரம் 10 -நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**නැටුම් (දේශිය) I**

**විශේෂ උපදෙස්:**

- සියලුම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- II, III, හා IV වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

* **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

## කොටස I

- අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

1. කරුණ රසය උපදවනු ලබන්නේ................................ නමැති ස්ථායිභාවය මුල්කොට ගෙනය.
   (1) විශ්මය (2) ශෝකය
   (3) ශම (4) උත්සාහය

2. සොකරි ගැමි නාටකය සඳහා වන්නි ප්‍රදේශයේ දී වාදනය කරනු ලබන්නේ ...............නම් වාද්‍ය භාණ්ඩය යි.
   (1) පහතරට බෙරය (2) ගැට බෙරය
   (3) උඩැක්කිය (4) දවුල

3. මහනුවර ඇසල පෙරහැරේ දී කාන්තා නියෝජනයක් දක්නට ලැබෙන්නේ ................ දේවාල පෙරහැරේදී ය.
   (1) කතරගම (2) විෂ්ණු
   (3) නාථ (4) පත්තිනි

4. රාජාඥාවක් සන්නිවේදනය කිරීමට අතීතයේ දී .................... වාදනය කර ඇත.
   (1) අණ බෙර (2) මළ බෙර
   (3) රණ බෙර (4) වද බෙර

5. නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහි ශාන්තිකර්මවල දක්නට ලැබෙන පොදු චාරිත්‍රයක් වන්නේ ..................... යි.
(1) මිල්ල කැපීම (2) කප් සිටුවීම
(3) තොටමෙට යාම (4) අයිලෙ යැදීම

6. "රටකට මව් සමඟින් ඒ නැව් නැග........" යන කවි පදය........... නැටුම සඳහා භාවිත කරයි.
(1) පන්තේරු (2) චාමර
(3) මෝල්ගස් (4) රබන්

7. මාත්‍රා 2+2+4 තිත් රූපය නම් කරනු ලබන්නේ ................. තුන් තිත ලෙස ය.
(1) දෙසුළු මැදුම් (2) සුළු මැදුම් මහ
(3) දෙසුළු මහ (4) සුළු දෙමහ

8. නර්තන නිර්මාණයේ දී අවකාශ භාවිතය හා සම්බන්ධ දිසා සංඛ්‍යාව............ කි.
(1) තුන (2) හය
(3) අට (4) දහය

9. "දෙවුන්දර උපුල්වන් දේවාලයේ හිංදු බාලිකාවන් නර්තනයේ යෙදුනු බවට ..." තොරතුරු ඉදිරිපත් කළ දේශාටන වාර්තාකරු වනුයේ............. ය.
(1) ඉබන් බතූතා (2) ස්පිල් බර්ජන්
(3) රොබට් නොක්ස් (4) පාහියන් භික්ෂුව

10. කුඹී කතාව මුද්‍රා නාට්‍යය .................. විසින් රංග රචනය කර ඇත.
(1) චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය (2) අංජලිකා චිත්‍රසේන මහත්මිය
(3) වජිරා චිත්‍රසේන මහත්මිය (4) මිරැන්ඩා හේමලතා මහත්මිය

11. ආගමික සිද්ධස්ථානවලට සීමා වූ කථක් නර්තනය රාජසභාවන් හි රඟ දැක්වීමට කටයුතු කළේ
(1) අච්චන් මහාරාජ් ය (2) නවාබ් වජීඩ් අලීෂා ය
(3) චක්‍රදාර් සිංග් ය (4) බිර්ජු මහාරාජ් ය

12. අරවිචෙට්ටු ද්‍රවිඩ ගැමි නැටුමට සමාන සිංහල ගැමි නැටුම වනුයේ,
(1) කුළු නැටුම ය (2) කළගෙඩි නැටුම ය
(3) ලී කෙළි නැටුම ය (4) ගොයම් කැපීමේ නැටුම ය

13. කෝළම් නාටකයේ දී සුසිර වාද්‍ය භාණ්ඩයක් ලෙස වාදනය කරනු ලබන්නේ
(1) හක් ගෙඩිය (2) හොරණෑව
(3) බටනලාව (4) කොම්බුව

14. රාධා හා ක්‍රිෂ්ණ ප්‍රේමවෘතාන්තය තේමා කර ගනිමින් නිර්මාණය වී ඇති නර්තන අංගය වනුයේ
(1) රාස්ලීලා ය (2) පරේන්ග් ය
(3) සංකීර්තන් ය (4) පුංග්චෝලම් ය

15. රජයේ පාසල්වල සෞන්දර්ය විෂය අනිවාර්ය විෂයක් බවට පත් වූයේ
(1) 1970 (2) 1972
(3) 1974 (4) 1978

16. දහඅට වන්නම් කෘතිය රචනා කර ඇත්තේ,
(1) එස්. පණීභාරත මහතා විසිනි
(2) මුදියන්සේ දිසානායක මහතා විසිනි
(3) තිස්ස කාරියවසම් මහතා විසිනි
(4) සී. ද එස්. කුලතිලක මහතා විසිනි


17. ග්‍රීක නාට්‍යයක් ඇසුරින් බන්ධුල ජයවර්ධන ශූරීන් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය වන්නේ
(1) විදුර නාට්‍යය
(2) තලමල පිපිලා නාට්‍යය
(3) බෙර හඬ නාට්‍යය
(4) නරි බෑනා නාට්‍යය


18. "තහලම් කල බෙර තම්මැට පට .........." යන කවි පදය ඇතුළත් සංදේශ කාව්‍ය වන්නේ
(1) තිසර සංදේශය
(2) පරවි සංදේශය
(3) සැවුල් සංදේශය
(4) මයුර සංදේශය

19. කථකලි නර්තන සම්ප්‍රදායේ නර්තන ශිල්පියාට කරනු ලබන මූලික අංග රචනය නම්
(1) මිනික්කු
(2) කත්ති
(3) පච්චා
(4) ඩෙප්පු

20. භරත නාට්‍යම් හි කළඑළි රංගනය හඳුන්වනුයේ,
(1) ශ්ලෝකම් නමිනි
(2) වර්ණම් නමිනි
(3) අරංගේත්‍රම් නමිනි
(4) තිල්ලානා නමිනි


21.










A B C D

මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසින් රචනා කරන ලද කෘතිය දැක්වෙන වරණය වනුයේ

(1) A (2) B (3) C (4) D

22. ප්‍රස්ථාරකරණයේ දී ^ ^ ˊ යන සංකේතවලින් නිරූපණය වනුයේ
(1) තිත් තිත් තිත් යන්නය
(2) තිත් තිත් තෙයි යන්නය
(3) තෙයි තෙයි තිත් යන්නය
(4) තෙයි තිත් තිත් යන්නය

23. යක්තුන් පදය, තොරණ් යාගය, මුදුන් තාලය යන නර්තන අංග පිළිවෙලින් දක්නට ලැබෙන්නේ
(1) උඩරට, සබරගමු හා පහතරට නර්තන සම්ප්‍රදායන්වල ය
(2) සබරගමු, උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන්වල ය
(3) පහතරට, සබරගමු හා උඩරට නර්තන සම්ප්‍රදායන්වල ය
(4) උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්වල ය

- අංක **24**, **25**, **26** යන ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | තම්මැට්ටම | සැලළිහිණිය | මෘදංගය | හපනා |
| 2 | පුංගි බෙරය | දිග් බෙරය | හත්පදය | යහන් දැක්ම |
| 3 | ග්‍රහ අපලය | වෙන්ඩාව | එකැස් බෙරය | පක්වාජ් |
| 4 | පත්තිනි | කොළොන්න පද | කරදිය | දවුල |

24. නර්තනයේ දී රංග භාණ්ඩයක් ලෙස භාවිතවන උපකරණ දැක්වෙන වරණය වන්නේ
    (1) 1 පේළියේ A තීරුවේ (2) 2 පේළියේ B තීරුවේ
    (3) 3 පේළියේ C තීරුවේ (4) 4 පේළියේ D තීරුවේ

25. පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් දෙකෙහිම භාවිත නර්තන අංගය දැක්වෙන්නේ
    (1) 2 පේළියේ C තීරුවේ (2) 2 පේළියේ D තීරුවේ
    (3) 4 පේළියේ A තීරුවේ (4) 4 පේළියේ B තීරුවේ

26. ප්‍රේමකුමාර එපිටවෙල මහත්මා විසින් නිර්මාණය කරන ලද මුද්‍රානාට්‍ය දැක්වෙන වරණය වන්නේ
    (1) 1 පේළියේ B තීරුවේ (2) 1 පේළියේ D තීරුවේ
    (3) 3 පේළියේ A තීරුවේ (4) 4 පේළියේ C තීරුවේ

27. නර්තනයේදී චලනය මාධ්‍ය වන අතර සංගීතයේදී මාධ්‍යය වන්නේ
    (1) ශබ්ද හා නාදය (2) නාදය හා සප්තස්වර
    (3) ශබ්දය හා හඬ (4) ශබ්දය හා ධ්වනිය

28. ආංගික අභිනයේ දී ඇහිබැම හා උරබාහු පිළිවෙලින් අයත් වන්නේ
    (1) අංග හා ප්‍රත්‍යාංග කොටසට (2) උපාංග හා අංග කොටසට
    (3) උපාංග හා ප්‍රත්‍යාංග කොටසට (4) ප්‍රත්‍යාංග හා උපාංග කොටසට

29. කෙනෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින්ම ඉදිරිපත් කරන අංග රචන ක්‍රමය
    (1) චරිතාංග අංග රචනය යි. (2) ශෛලිගත අංග රචනය යි.
    (3) විකාර රූපී අංග රචනය යි. (4) ස්වභාවික අංග රචනය යි.

30. අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම නර්තන අධ්‍යක්ෂ ධූරය දැරූ කාන්තාව වනුයේ
    (1) චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය යි (2) මිරැන්ඩා හේමලතා මහත්මිය යි
    (3) වජිරා චිත්‍රසේන මහත්මිය යි (4) පද්මිනී දහනායක මහත්මිය යි

## II කොටස - උඩරට නර්තනය

31. උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
(1) සත් කෝරළය, උඩු නුවර, හාරිස්පත්තුව
(2) යටි නුවර, කුරුවිට, සතර කෝරළය
(3) බලන්ගොඩ, දුම්බර, ගාල්ල
(4) හේවාහැට, මාතර, රත්නපුර

32. උඩරට වන්නමකට අයත් කොටස් ගණන
(1) හතරකි
(2) පහකි
(3) හයකි
(4) හතකි

33. මාත්‍රා 2 + 2 සුළු තනි තිතට අයත් බෙර පදය
(1) ජිං ගත ගො ගො ය
(2) කුද ගත ගත දොම් ය
(3) දොං දොං ජිං ජිං ගජිගත ය
(4) දොං දොං ගජිං තකට ය

34. උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් අයත් වන්නම් දෙකකි.
(1) තුරඟා, සැවුලා
(2) මුසලඩි, හනුමා
(3) වෛරොඩි, තුරඟා
(4) සිංහරාජ, සැවුලා

35. කොහොඹායක් කංකාරි ශාන්ති කර්මයේ පුරාවෘත්ත කතාවට අනුව දිවි දෝෂය වැළඳුණු රජු
(1) මලය රජු ය
(2) විජය රජු ය
(3) සේරමාන් රජු ය
(4) පඬුවස්දෙව් රජු ය

36. සිංහරාජ හා සැවුලා වන්නම් හි තාලරූප පිළිවෙලින්
(1) මාත්‍රා 4+4 හා මාත්‍රා 2+4
(2) මාත්‍රා 2+3 හා මාත්‍රා 4+4
(3) මාත්‍රා 2+4 හා මාත්‍රා 4+4
(4) මාත්‍රා 4+4 හා මාත්‍රා 2+3

37. කොහොඹායක් කංකාරි ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි දෙකකි.
(1) යක්කම් හා යක්තුන් පදය
(2) ගුරුගේ මාලාව හා යක්කම්
(3) ඌරා යක්කම හා අස්නය
(4) පලවැළ දානය හා යක්ඇනුම

38. මෙම අඩච්ච සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න
"තාකු තක්කුං තරිකිට .......... තත්ජෙං - තත්ජෙං ............. තත්ජෙං"
(1) තරිකිට - තකුද
(2) තරිකිට - තත්ජෙං
(3) තත්ජෙං - තජෙං
(4) තකුද - තජෙං

39. උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් කොටස් දැක්වෙන වරණය වන්නේ
(1) හැඩකැල්ල, බුබුළු පටිය හා ජටාව
(2) වෙස් තට්ටුව, හැට්ටය හා කෙමෙත්ත
(3) උල්උඩය, ශිඛා බන්ධනය හා බුබුළු පටිය
(4) හස්තකඩය, අවුල්හැරය හා උරබාහු

40. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙක් වන්නේ
(1) ජේ. ඊ. සේදරමන් මහතා සහ එස්. පණිභාරත මහතා
(2) කේ. එස්. ප්‍රනාන්දු මහතා සහ රද්දැල්ලේ පොඩිමහත්තයා මහතා
(3) එන්. සිරිබෝහාමි මහතා සහ ජේ. ඊ. සේදරමන් මහතා
(4) එස්. පණිභාරත මහතා සහ ඒ. ඊ. ඉඹුල්ගොඩ මහතා

**III කොටස -** පහතරට නර්තනය

31. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
(1) ගාල්ල, මාතර, හම්බන්තොට
(2) හොරණ, කෑගල්ල, බදුල්ල
(3) පානදුර, අම්බලන්ගොඩ, මහනුවර
(4) ගාල්ල, බදුල්ල, හම්බන්තොට

32. පහතරට සින්දු වන්නමකට අයත් කොටස් ගණන
(1) පහකි
(2) හයකි
(3) හතරකි
(4) හතකි

33. මාත්‍රා 2 + 2 සුළු තනි තිතට අයත් බෙර පදය
(1) ගුංද දෙගත ගති ගත ගුද ය
(2) රුද කිට තත් දොම් ය
(3) දිත් තම් දිතම් ය
(4) රෙගත ගතකු දොම් ය

34. පහතරට නර්තන සම්ප්‍රදායට පමණක් අයත් වන්නම් දෙකකි.
(1) මුසලඩි හා ශුද්ධ තාලය
(2) නෛයඩි හා සැවුලා
(3) ඊශ්වර කුණ්ඩ තාලය හා ශුද්ධ තාලය
(4) කොවුලා හා ඊරඩි

35. දෙවොල්මඩු ශාන්ති කර්මයේ පුරාවෘත්ත කතාවට අනුව හිසරුදාව වැළඳුණු රජු වන්නේ
(1) මලය රජු ය
(2) පඬුවස්දෙව් රජු ය
(3) පඬි රජු ය
(4) සේරමාන් රජු ය

36. නාතිලිංචි තාලය සිංදු වන්නම හා අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නමෙහි තාල රූප පිළිවෙලින්
(1) මාත්‍රා 2 + 4 හා මාත්‍රා 4 + 4
(2) මාත්‍රා 4+ 4 හා මාත්‍රා 2 + 4
(3) මාත්‍රා 2 + 2 හා මාත්‍රා 2 + 3
(4) මාත්‍රා 2 + 4 හා මාත්‍රා 3 + 3

37. දෙවොල්මඩු ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි දෙකකි.
(1) තොරණ් යාගය හා මී බන්ධනය
(2) ඇත් බන්ධනය හා අඹ විදමන
(3) යහන් දැක්ම හා පත්තිනි
(4) දෙවොල් ගොඩ බැසීම හා හත්පද පෙළපාලිය

38. මෙම ඉරට්ටිය සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න
"තකදිත්......... කිත්තත්............... තරිගත දිකු දොම්"
(1) ගදිගත - කිට තක
(2) ගදිගත - ගුද ගත
(3) ගුංදත් - කිටතක
(4) කතදොම් - කිට්තක

39. පහතරට දෙවොල් ඇඳුම් කට්ටලයට අයත් කොටස් දැක්වෙන වරණය වන්නේ
(1) සේලය, ඉණ හැඩය හා පච්චවඩම (2) හැට්ටය, අවුල් හැරය හා කාඟුල් කුට්ටම
(3) කාඟුල් කුට්ටම, හැට්ටය හා රැළි සාය (4) හගල, සිඛා බන්ධනය හා කාඟුල් කුට්ටම

40. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙක් වන්නේ
(1) විල්සන් ඕලබොඩුව මහතා සහ කේ. එස්. ප්‍රනාන්දු මහතා
(2) අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා සහ එස්. පණීභාරත මහතා
(3) රද්දැල්ලේ පොඩිමහත්තයා මහතා සහ ජේ. ඊ. සේදරමන් මහතා
(4) සිරිබෝහාමි මහතා සහ ජේ. ඊ. සේදරමන් මහතා

## IV කොටස - සබරගමු නර්තන

31. සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
(1) රත්නපුර, බලන්ගොඩ, කලවාන (2) කෑගල්ල, කුරුවිට, ඇඹිලිපිටිය
(3) බලන්ගොඩ, අම්බලන්ගොඩ, ඇහැලියගොඩ (4) කලවාන, වැලිමඩ, හොරණ

32. සබරගමු වන්නමකට අයත් කොටස් ගණන
(1) හත කි. (2) හතර කි.
(3) පහ කි. (4) හය කි.

33. මාත්‍රා 2 + 2 සුළු තනි තිතට අයත් දවුල් පදය
(1) ජිංත ගතා දොම් ය (2) ජිමිත කුඳා දොම් ය
(3) කුදත් තක්කිට තකට ජිමිතක ය (4) ජිං කිටිතක් තත් කිටිතක ය

34. සබරගමු නර්තන සම්ප්‍රදායට පමණක් අයත් වන්නම් දෙකකි.
(1) විරාඩි සහ ගජගා (2) හනුමා සහ සිංහරාජ
(3)කොවුලා සහ අනිලා (4) අටකුරු ගාහක සහ තුරඟා

35. පහන්මඩු ශාන්ති කර්මයේ පුරාවෘත්ත කතාවට අනුව හිසරුදාව වැළඳුණු රජු වන්නේ
(1)මලය රජු ය (2) පඬුවස්දෙව් රජු ය
(3)පඬි රජු ය (4) සේරමාන් රජු ය

36. කදම්භ පක්ෂි හා මණ්ඩුක වන්නම්හි තාල රූප පිළිවෙලින්
(1) මාත්‍රා 3 + 3 හා මාත්‍රා 3 + 4 (2) මාත්‍රා 3 + 4 හා මාත්‍රා 3+3
(3) මාත්‍රා 2+3 හා මාත්‍රා 2+2 (4) මාත්‍රා 2 + 3 හා මාත්‍රා 2 +4

37. පහන්මඩු ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාළි දෙකකි.
(1) තොරණ් යාගය හා යහන් දැක්ම (2) අඹ විදමන හා පොත්කඩේ පාලිය
(3) අයිලේ යැදීම හා දෙවොල් ගොඩ බැසීම (4) හත්පද පෙළ පාලිය හා රාමා මැරීම

38. මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න
"ගත්තකු ............ දොංගඩ............ජිංතත් දොං කුද ගත කුද"
(1) ජිංදං - තකුජිත් (2) ජිත්තම් - ජිජිකුද
(3) ජිංකුද - ජිංදම් (4) ජිත්තත් - තරිකිට

39. සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් කොටස් දැක්වෙන වරණය වන්නේ
(1) හැට්ටය, කරපටිය හා උල්උඩය (2) සේලය, අවුල්හැරය හා පච්චවඩම
(3) හැඩකැල්ල, පබළු හැට්ටය හා නෙත්තිමාලය (4) හගල, ජටාව හා රතු රෙද්ද

40. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙක් වන්නේ
(1) සිරිබෝහාමි මහතා සහ රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා
(2) සිරිබෝහාමි මහතා සහ ජේ. ඊ. සේදරමන් මහතා
(3) පණිභාරත මහතා සහ අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා
(4) කේ. එස්. ප්‍රනාන්දු මහතා සහ රද්දැල්ලේ පොඩිමහත්තයා මහතා

**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 44 | S | II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**නැටුම් (දේශිය) I,II**
நடனம் (சுதேச) **I,II**
Dancing (Oriental) **I,II**

**නැටුම් (දේශිය) II**

* **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

**1. සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංක යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) රස හා භාව සංකල්පය පිළිබඳ භරතමුනි විසින් ලියන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථය වන්නේ.................................. යි.

(ii) " කටදොඩවන්නේ ගිය ගිය තැන පෙරලෙන්නේ " යන කවි පදයෙන් කියවෙන ගැමි නාටකයට අයත් චරිතය වන්නේ…………ය.

(iii) .................................. වට්ටම මාත්‍රා 2 + 2 + 4 තාලරූපයට අයත් වේ.

(iv) ශාන්ති කර්ම ආශ්‍රිතව සැරසිලි නිර්මාණය කිරීමේදී ..................................කලාවෙන් ලැබෙන පිටිවහල වැදගත් වේ.

(v) මණිපූරී නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්‍ය භාණ්ඩය .................................. නමින් හඳුන්වයි.

(vi) "පහත රට ශාන්ති කර්ම සාහිත්‍ය " කෘතිය රචනා කරන ලද්දේ.................................. මහතාය.

(vii) "අයිලය " යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් .................................. ශාන්ති කර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

(viii) 1968 වර්ෂයේදී **රන්දද** නැමැති මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ .................................. මහතාය.

(ix) මනිපුරි නර්තන සම්ප්‍රදායේ රාධාගේ රංගවස්ත්‍රාභරණවලට අයත් කෙටිසාය හා හිසට පළඳින වේලය හඳුන්වන නාමයන් වන්නේ (1).................................. ,(2) .................................. .

(x) නර්තන කලාවේ නූතන ප්‍රවණතා ලෙස පහත සඳහන් වර්ෂවල සිදුවූ සුවිශේෂී සිදුවීම් වන්නේ,
1952 (1) .................................. , 1956 (2) .................................. .

**2.**

(i) මාත්‍රා 3+4 උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) පහත දැක්වෙන කවි පද කොටස මාත්‍රා 2 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න .
"පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම"

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව හෝ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ විරාඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) වන්නම්
(ii) නමස්කාර ගාථා
(iii) මිරැන්ඩා හේමලතා මහත්මිය
(iv) අංග රචනය
(v) කරදිය මුද්‍රා නාට්‍යය

**4.** දේශීය ශාන්ති කර්ම පිළිබඳ විමසීමේ දී පූජාවිධි රටාවේ අන්තර්ගත පොදු ලක්ෂණ මෙන්ම අනන්‍යතා ලක්ෂණ ද පිළිබිඹු වේ.
(i) පහන් මඩුවේ අන්තර්ගත චාරිත්‍රවිධි දෙකක් නම්කර කෙටියෙන් හඳුන්වන්න.
(ii) දෙවොල්මඩු ශාන්තිකර්මයට පමණක් ආවේණික වූ ගායනය සහිත නර්තන අංගයක් නම්කර එය විස්තර කරන්න.
(iii) කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ කතා පුවතෙන් පිළිබිඹු වන මානව ගුණධර්ම පිළිබඳ ඇගයීමක් කරන්න.

**5.** (i) සිංහල ගැමි නැටුමේ එන කළ ගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම නම් කර ඒ පිළිබඳ ව කෙටියෙන් පැහැදිළි කරන්න.
(ii) ගැමි නැටුම හා සම්බන්ධ ගායනාවලින් පිළිබිඹු වන ඇදහිළි හා විශ්වාස පිළිබඳ ව උදාහරණ දෙමින් විස්තර කරන්න.
(iii) "කෝළම් නාටකය මඟින් සමාජ විවරණයක් සිදු වේ."මෙම කියමන පැහැදිළි කරන්න.

**6.** පහත දැක්වෙන රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B




C

(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය සඳහන් කර නර්තන අංග තුනක් නම් කරන්න.
(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්කර එය ආහාර්ය අභිනයෙන් පොහොසත් බවට කරුණු ඉදිරිපත් කරන්න.
(iii) C රූපයේ දැක්වෙන කලා කෘතිය නම් කර එහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

**7.** (i) නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගත හැකි මානවීය ගුණාංග දෙකක් ඇගයීමට ලක් කරන්න.
(ii) නර්තන කලාවේ උන්නතියට වේදිකා ප්‍රසංගවල දායකත්වය පැහැදිළි කරන්න.
(iii) අන්තර්ජාතික වශයෙන් නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම විස්තර කරන්න.

*****